## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - 2015

---------------------------------------

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරීත්ව වාර්තාව, ස්කන්ධය වෙනස්වීමේ වාර්තාව සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ සහ 2012 අංක 15 දරන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 46 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000 – 1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයපථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන
------------------

2.1 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
-----------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල පරිශ්‍රය වටා තාප්පය ඉදිකිරීම වෙනුවෙන් වැය කළ රු.10,097,647 ක් ඉඩම් යටතේ ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් ක්ෂය ගණනය කිරීම සඳහා අදාල කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) ප්‍රාග්ධන ස්වරූපයේ නොවන ජල උපකරණ (**Water Dispenser**) 7 ක් මිලදී ගැනීම සඳහා වැයකළ රු.95,500 ක් අයභාර වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) මූල්‍ය ක්‍රියාකාරිත්ව වාර්තාවේ මෙහෙයුම් ආදායම් ලෙස දක්වා තිබෙන රු.230,962 ක අයි වෙන්කිරීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ඌනතාවයට ගැලපීම් කර නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 570 හා 571 පරිදි තැන්පත් කළ දින සිට වර්ෂ 2ක් ඉක්මවූ පොදු තැන්පත් මුදල්, ආදායමට බැර කිරීමට කටයුතුකළ යුතු වුවත් වර්ෂ 3කට අධික කාලයක සිට පවතින රු.1,196,643 ක්වූ කොන්ත්‍රාත් රඳවාගැනීම් 12 ක් විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය
------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 36,199,372 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 4,615,312ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.31,584,060 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පුද්ගල පඩිනඩි සඳහා වියදම රු.26,048,580 කින් ඉහළයාම සහ වාර්ෂික ක්ෂය ප්‍රතිපාදනය රු.12,038,919 කින් ඉහළ යෑම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වූ ඌණතාවයක් පැවති අතර 2014 වර්ෂය හා සැසඳීමේදී 2015 වර්ෂයේදී ඌනතාවය සියයට 684 කින් වැඩි වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය ගැලපීමෙන් පසු 2011 වර්ෂයේදී රු.53,603,442 ක්වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර 2014 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් එය රු.131,059,384 ක් හා රු.137,562,822 ක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

4.1 කාර්යසාධනය
-----------------

4.1.1 පර්යේෂණ කාර්යසාධනය
---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් 2014 සහ 2015 වර්ෂවල සිදුකර තිබුණු පර්යේෂණ 63 ක් සම්බන්ධයෙන් පර්යේෂණ පිළිබඳ ඉදිරිපත් කළයුතු අර්ධ වාර්ෂික පගති වාර්තා හෝ අවසන් වාර්තා පර්යේෂණ හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) 2011, 2012 සහ 2013 වර්ෂවල සිදුකරන ලද පර්යේෂණ 18 කට අදාල අවසන් වාර්තා 2015 නොවැම්බර් මාසය වන විටත් පර්යේෂණ හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්
---------------------------------

සමාලෝචිත වර්ෂයේ පළමු සමාසිකයේ විශ්වවිද්‍යාලයේ පාඨමාලාවන්ට අයත් විෂයයන් 09 කට අදාළව පැය 940 ක බාහිර දේශන පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත්, දේශන පවත්වා තිබූ පැය ගණන 512 ක් විය. මේ අනුව අදාළ පාඨමාලා අපේක්ෂාකළ ගුණාත්මක තත්ත්වයෙන් සිදු වූයේද යන්න තහවුරු කරගත නොහැකි විය.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.109,500 ක් වූ **Digital Duplicator** යන්තයක් අලුත්වැඩියා කිරීමකින් තොරව වසරකට වඩා වැඩි කාලයක සිට ගබඩාකර තිබුණු අතර එම යන්තය සඳහා මිලදී ගෙන තිබුණු රු. 43,920 ක් වටිනා තීන්ත සහ ඩුප්ලෝ මාස්ටර් රෝල් ද භාවිතයට ගත නොහැකිව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) විශ්වවිද්‍යාල භූමියෙහි සිටුවා ඇති විවිධ පැල වර්ග ආවරණය කිරීම සඳහා රු.51,140 ක් වැයකර හදිසි මිලදී ගැනීම් ලෙස ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව දැල් රෝල් 4 ක් 2014 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු අතර 2016 වර්ෂය වන විටත් අදාල කාර්යය සඳහා භාවිතා නොකර ඒවා නිෂ්කාර්යව පැවතුණි.

4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය
------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිව්මහල් පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම
-------------------------------------------------

ව්‍යාපෘති වටිනාකම රු.300,000,000 ක්වූ සිව්මහල් පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය කර කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගතයුතු වුවත්, ඊට පටහැනි ලෙස කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන නිර්මාණය කර ගොඩනැගීමේ (Turn Key -Design & Build) ක්‍රමයට රු. 298,243,208 ක අගයකට කොන්ත්‍රාත්තුව පිරිනමා

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු.233,233,858 ක් ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) පුස්තකාල ගොඩනැගිල්ලේ තෙවන මහලේ ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට යෝජිතව තිබුණු අතර ඉදිකිරීම් ආරම්භ කිරීමෙන් පසු කරනු ලැබූ සංශෝධනවලට අනුව ශ්‍රවණාගාරය වෙනුවට බුදුමැදුරක් සහිත සක්මන් මළුවක් ඉදිකිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්තුවේ විෂය පථය වෙනස්වීම මත අංක 02/2012 හා 2012 අගෝස්තු 07 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව ඇස්තමේන්තු පරීක්ෂණ කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබූ සැලසුම් ප්‍රකාරව කළවැඩ පිළිබඳ විස්තරාත්මක වාර්තා ඉදිරිපත් නොවීම හේතුවෙන් ඉදිකිරීම්වල නිවැරදිභාවය පිළිබඳව විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

**(iii)** ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(ඒ) ශ්‍රවණාගාරයට අදාල එහෙත් බුදුමැදුර විෂයට අයත් නොවන ඉටු නොකළ වැඩ විෂයන් 06 ක් සඳහා ශ්‍රවණාගාර ඉදි කිරීම් කටයුතු ලෙස සලකා රු. 2,440,000 ක් ගෙවීම්කර තිබුණි.

(බී) පුස්තකාල ගොඩනැගිල්ල තුළ බීටීයූ 24000 ක ධාරිතාවයේ වායුසමීකරණ යන්ත්‍ර 8 ක් සවි කිරීම සඳහා රු.5,500,000 ක් ගෙවා තිබූ නමුත් එම ධාරිතාවයේ වායුසමීකරණ යන්ත්‍ර 6 ක් පමණක් සවිකර තිබුණි. පිරිවැය රු. 1,375,000 ක්වූ සවි නොකරන ලද වායුසමීකරණ යන්ත්‍ර 2 වෙනුවට රු.451,975 ක් ලෙස ඇස්තමේන්තු කරන ලද යකඩ ග්‍රිල් ජනෙල් 52 ක් සවිකර තිබුණි. ඒ අනුව රු.923,025 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(සී) අනුමත නිදර්ශකවලට අනුව වසරක වගකීමක් සහිත **Electronic Ballast** වර්ගයේ **BRAVO** වෙළඳ නාමය යටතේ වූ අඩි 2 ක දිගින් යුත් ප්‍රතිදීප්ත ලාම්පු (**Fluorescent Lamp Set**) 83 ක් සවි කළ යුතු වුවද, වගකීම් සහතික ලබාදී නොතිබුණු **Choke Ballast** වර්ගයට අයත් **hipper** වෙළඳ නාමය යටතේ සපයා තිබූ විදුලි ලාම්පු 59 ක් පමණක් සවිකර තිබියදී රු.15,653,105 ක් වූ සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි.

**(iv)** අනුමත ප්‍රමිතියෙන් බැහැරව සිදුකරන ලද ඉදිකිරීම්

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(ඒ) ඉදිකිරීම් පිරිවිතරයන් අනුව පුස්තකාලයේ ඉදිරි දොරටුව හා දෙපස වර්ග මීටර් 12.42 ක ප්‍රදේශය මි.මී 10 ක ඝනකම සහිත වීදුරුද අභ්‍යන්තර වෙන් කිරීම් හා අනෙකුත් දොර ජනෙල් ආදිය මි.මී 6 ක ඝනකම වීදුරුද යොදා ඇලුමිනියම් රාමු මත සවිකළ යුතු වුවද සියලු සවිකිරීම් මි.මී 5 ක ඝනකම සහිත වීදුරු යොදාගෙන තිබුණි. එහෙත් ගෙවීම් කිරීමේදී ඊට අදාල මිල විශ්ලේෂණ ලබාගෙන අඩුකිරීම් සිදු නොකර මිල යෝජනාවේ අයිතම අංක 3.10 ඇලුමිනියම් වැඩ යටතේ දක්වා තිබුණු රු.13,204,389 ක්වූ මුළු මුදලම ගෙවා තිබුණි.

(බී) පුස්තකාල ගොඩනැගිල්ලේ මහල් 3 ක ස්ථාන 06 ක තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබූ පරිදි පොළව මත **loop pile carpet** යොදා **Timber skirting** කළයුතු වුවද ඒ අනුව ඉදිකිරීම් සිදුකර නොතිබුණි.

(සී) තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය ප්‍රකාරව පුස්තකාල ගොඩනැගිල්ලේ සිවිලිමට **mineral fiber super flex** සිවිලිං සීට් භාවිතා කළ යුතු වුවත් වෙළඳපොළේ අඩු වියදම් සිවිලිං ලෙස භාවිතා කරන ගුණාත්මක බවින් ඉතා අඩු සිවිලිං ලැල්ලක් භාවිතා කර සිවිලිම සකස්කර තිබූ බැවින් ඉදිකිරීම් අවසන් කර මාස 2කට පසුව 2016 මාර්තු 15 දින සිදුකරන ලද විගණන පරීක්ෂණ අවස්ථාව වන විට සිවිලිං ලැලි ඇද වී පළුදු වී තිබුණි.

(ඩී) අභ්‍යන්තර දුරකතන පද්ධතිය හා ජාලකරණ පද්ධතිය සවිකර ස්ථාපිත කිරීම සඳහා රු. 2,955,000ක් ගෙවීම් කර තිබූ අතර, අදාල වයර් හා කේබල් ඇද දුරකතන 28 ක් සපයා තිබූ නමුත් එම දුරකථන ස්ථාපිත කර නොතිබුණු අතර ජාලකරණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය පරීක්ෂාකර භාරගෙන නොතිබුණු බැවින් ජාලකරණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තහවුරුවක් ලබාගැනීමට නොහැකි විය.

(ආ) විශ්වවිද්‍යාලයේ උද්‍යාන අලංකරණ කටයුතු සඳහා රු.2,510,000 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණු අතර, ඒ සඳහා ඉක්ටෑඩ් ආයතනයේ ශ්‍රේණිගත කිරීම් හා මූල්‍ය සීමාව ප්‍රකාරව **ICTAD SP-4** යටතේ සුදුසුකම් ලැබූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම සිදු නොකර **ICTAD SP -3** මූලික සුදුසුකම් සපුරාලන ලද කොන්ත්‍රාත් කරුවන්ගෙන් පමණක් ලංසු කැඳවීම නිසා එක් ලංසුවක් පමණක් ලැබී තිබුණි. මේ අනුව තරඟකාරීත්වය තුළින් ආයතනයට ලබාගත හැකිව තිබුණු මූල්‍යමය වාසිය ආයතනයට ලැබී නොතිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය
------------------------------

විශ්වවිද්‍යාලයේ අනධ්‍යන කාර්ය මණ්ඩලයට අයත් ලේඛකාධිකාරී හා මූල්‍යාධිකාරී යන ප්‍රධාන තනතුරු 2 සඳහා 2012 වර්ෂයේ සිට ස්ථිර නිලධාරීන් පත් නොකර වෙනත් විශ්වවිද්‍යාලවල සප්ත වාර්ෂික නිවාඩු ලබා පැමිණෙන නිලධාරීන් තාවකාලිකව හා වෙනත් විශ්වවිද්‍යාලවල නිලධාරීන් වැඩ බැලීමේ පදනම මත පත්කිරීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණු අතර විශ්වවිද්‍යාලයේ කාර්යක්ෂම පරිපාලනයක් පවත්වාගෙන යෑම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය
----------------------------------------

5.1 අභ්‍යන්තර විගණනය
------------------------

සහකාර අභ්‍යන්තර විගණක තනතුර 2013 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතීම හේතුවෙන් අභ්‍යන්තර විගණන කටයුතු සතුටුදායක මට්ටමක සිදුවී නොතිබුණි.

6 පද්ධති හා පාලනයන්
----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත යොමු කරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| | ----------------------------- | -------------- |
| (අ) | ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කොන්ත්‍රාත්කරුවන් තෝරා නොගැනීම හා ඉදිකිරීම් කටයුතු සිදු නොකිරීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රධාන විධායක තනතුරු පුරප්පාඩු නිත්‍ය ලෙස සම්පූර්ණ නොකිරීම. |
| (ඇ) | අයවැය පාලනය | අයවැයගත වියදම් හා ආදායම් තත්‍ය වියදම් හා ආදායම් සමඟ නොසැසඳීම. |